# ශීර්ෂය - 234

# ශ්‍රේෂ්ඨාධිකරණය රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව

## දැක්ම හා මෙහෙවර

ශ්‍රී ලංකා අධිකරණ පද්ධතියේ ඉහලම අධිකරණය ශ්‍රේෂ්ඨාධිකරණයයි. අග්‍ර විනිශ්චයකාරතුමා ඇතුළු ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරුන් 11 දෙනා අතිගරු ජනාධිපතිතුමා විසින් පත් කරනු ලබන අතර, අනෙකුත් සියළුම උසාවි සම්බන්ධව අභියාචනාධිකරණ බලය එමගින් ක්‍රියාත්මක වේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ශ්‍රේෂ්ඨාධිකරණයට පහත කරුණු සම්බන්ධයෙන් බලය ලබා දෙයි.

## කාර්යයන් -

- මූලික අයිතිවාසිකම් සම්බන්ධ අධිකරණ බලය.
- අවසාන අභියාචනා අධිකරණ බලය.
- උපදේශක අධිකරණ බලය.
- මැතිවරණ පෙත්සම් (ජනාධිපතිවරණ) සම්බන්ධ අධිකරණ බලය.
- කවරම ආකාරයක හෝ පාර්ලිමේන්තු වරප්‍රසාද උල්ලංඝනය කිරීම පිළිබද අධිකරණ බලය.
- පාර්ලිමේන්තුව විසින් නිතියෙන් නියම කරනු ලැබිය හැකි වෙනත් කාරණාවක් පිළිබද අධිකරණ බලය.

ශ්‍රේෂ්ඨාධිකරණ රෙජිස්ට්‍රාර් කාර්යාලය ශ්‍රේෂ්ඨාධිකරණයේ කටයුතු සදහා සහාය දක්වන අතර, ඒ සදහා අධිකරණ අමාත්‍යංශයේ 234 ශීර්ෂය යටතේ ප්‍රතිපාදන සපයයි. ශ්‍රේෂ්ඨාධිකරණ රෙජිස්ට්‍රාර් කාර්යාලයේ කාර්යයන් පහත පරිදි වේ.

- ශ්‍රේෂ්ඨාධිකරණයේ වාර්තා තබා ගැනීම.
- ශ්‍රේෂ්ඨාධිකරණයේ රැස්වීම් පිළියෙල කිරිම සහ ඉල්ලීම් දින ගත කිරීම.
- අධිකරණ නියෝගයන්ට සහ නඩු තීන්දුවලට අනුකූලව ප්‍රකාශ වාර්තා ගත කිරීම.
- ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරුන් බදවා ගැනීම.
- අභියාචනා අධිකරණයෙන් ලැබෙන අභියාචනා නඩුවල පිටපත් සකස් කිරීම නඩු ගාස්තු තක්සේරු කිරීම.

## 2017.12.31 දිනට ශ්‍රේෂ්ඨාධිකරණයේ කාර්ය මණ්ඩල විස්තර

| | **අනුමත සංඛ්‍යාව** | **සත්‍ය සංඛ්‍යාව** |
|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 05 | 06 |
| තෘතියික මට්ටම | 13 | **12** |
| ද්විතියික මට්ටම | 111 | **73** |
| ප්‍රාථමික මට්ටම | 103 | **93** |

## ශ්‍රේෂ්ඨාධිකරණයේ වාර්ෂික අයවැය ප්‍රතිපාදන හා සත්‍ය වියදම

| | ඇස්තමේන්තු (රු) | සත්‍ය වියදම (රු) |
|---|---|---|
| 2014 | 74,660,000.00 | 62,005,603.00 |
| 2015 | 95,240,000.00 | 81,036,020.00 |
| 2016 | 101,220,000.00 | 90,545,577.00 |
| 2017 | 109,755,000.00 | 97,482,785.00 |

# ශ්‍රේෂ්ඨාධිකරණ රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ
# 2017.01.01 සිට 2017.12.31 දක්වා කාර්ය සාධනය

| නඩු වර්ගය | **2017.01.01 දිනට විසඳීමට ඇති නඩු සංඛ්‍යාව** | **2017.01.01 සිට 2017.12.31 දිනට ගොනු කල නඩු සංඛ්‍යාව** | **2017.01.01 සිට 2017.12.31 දක්වා විසඳීමට ඇති මුළු නඩු සංඛ්‍යාව** | **2017.01.01 සිට 2017.12.31 දිනට අවසන් කල නඩු සංඛ්‍යාව** | **2017.12.31 දිනට විසඳීමට ඇති ඉතිරි නඩු සංඛ්‍යාව** |
|---|---|---|---|---|---|
| මූලික අයිතිවාසිකම් | 912 | 464 | 1376 | 371 | 1005 |
| විශේෂ අවසර ඉල්ලුම් පත්‍ර | 482 | 296 | 778 | 223 | 555 |
| පාර්ලිමේන්තු පනත් කෙටුම්පත් පිලිබද ශ්‍රේෂ්ඨාධිකරණයේ නියෝග | - | 34 | 34 | 34 | - |
| අභියාචනා නඩු | 420 | 249 | 669 | 177 | 492 |
| වාණිජ මහාධිකරණ අභියාචන නඩු | 197 | 57 | 254 | 37 | 217 |
| මහාධිකරණ අවසර ඉල්ලුම්පත් | 152 | 142 | 294 | 77 | 217 |
| රිට් ඉල්ලුම්පත් | 08 | 08 | 16 | - | 16 |
| පළාත්බද මහාධිකරණ අභියාචනා නඩු | 1326 | 550 | 1876 | 412 | 1464 |
| ප්‍රතිශෝධන නඩු | 16 | 07 | 23 | 08 | 15 |
| ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අර්ථ නිරූපනය සම්බන්ධ නඩු | - | - | - | - | - |
| විවිධ නඩු | 19 | 01 | 20 | 02 | 18 |
| SC TAB APPEAL | 01 | 03 | 04 | - | 04 |
| SC SPECIAL | 12 | - | 12 | 07 | 05 |
| SC/Contempt | 21 | 06 | 27 | 02 | 25 |
| එකතුව | 3566 | 1817 | 5383 | 1350 | 4033 |